# දරුවන් උදෙසා බයිබලයක්

# යෝනා සහ විශාල මත්ස්‍යයා



ඉදිරිපත් කරන්නා: Edward Hughes

නිදර්ශනය කරන්නා: Jonathan Hay
Alastair Paterson

සකස්කරන්නා: Mary-Anne S.

පරිවර්ථනය කරන්නා

නිෂ්පාදනය කරන්නා: Bible for Children
www.M1914.org

©2023 Bible for Children, Inc.
අවසරය : මෙම කථාන්තරය උපුටා ගැනිමට හෝ මුද්‍රණය කිරීමට අවසර ඇතිමුත් එය විකිණීමට අවසර නැත.

වසර ගණනාවකට පෙර යෝනා නම් මිනිසෙක් ඊශ්‍රායෙල් දේශයේ වාසය කළේය. දිනක් දෙවියන් වහන්සේ ඔහුට ලෝකයේ විශාලතම, බලවත්ම නගරය වන නිනිවයට යෑමට කීසේක.



යෝනා එහි සිටි සියලුම මිනිසුන්ට ඔවුන්
කෙතරම් දුෂ්ඨද යන්න දෙවියන් වහන්සේ
දන්නා බව අනතුරු ඇඟවීමට
නියමිතව සිටියේය.




යෝනා දෙවියන් වහන්සේට
අකීකරු වූයේය! යෝනා නැවකට
නැඟී නිනිවයට යනවා වෙනුවට
ඊට ප්‍රතිවිරුද්ධ දිශාව වූ තර්ෂිෂ්
නම් ස්ථානයට යාත්‍රා කළේය.

දෙවි සමිඳාණන් වහන්සේ මහා සුළඟක් මුහුදට එවූ සේක.
විශාල කුණාටුවක් ඇති විය! නැව කැඩී ගොස් ගිලී යනු ඇතැයි
නැවියෝ බිය වූවෝය.



කුණාටුව වඩ වඩාත් දරුණු විය. භීතියට පත් නැවියෝ තම දෙවිවරුන්ට යාච්ඤා කර නැව සැහැල්ලු කිරීම සඳහා සියලු භාණ්ඩ මුහුදට විසි කළෝය. නමුත් ඒ කිසිවකින් කුණාටුව නතර නොවිණි.



යාඥා නොකර සිටි එකම පුද්ගලයා යෝනා ය. ඒ වෙනුවට, ඔහු නැව තුළ වැතිර නිදා සිටියේය. නැවේ කපිතාන්වරයා ඔහුව සොයා ගත්තේය. “ඔබ නිදා සිටිමින් කුමක් කරන්නේද? නැගිටින්න! ඔබේ දෙවියන්ට යාච්ඤා කරන්න! සමහර විට දෙවියන් වහන්සේ අප ගැන සිතනු ඇත, එවිට අප විනාශ නොවනු ඇතැ”යි ඔහු කීවේය.



ඔවුන්ට ආ කරදරයට යෝනාගේ සම්බන්ධයක් ඇති බව නැවියෝ ඉක්මනින්ම තීරණය කළෝය. තමන් ස්වාමින් වහන්සේ වෙතින් පලා යන බව ඔහු ඔවුන්ට කීවේය. “මුහුද සන්සුන් වන පිණිස අපි ඔබට කුමක් කළ යුතු දැ”යි ඔව්හු ඇසුවෝය. “මාව ඔසවා මුහුදට විසි කරන්න,” යෝනා පිළිතුරු දුන්නේය. “මක්නිසාද මේ මහා කුණාටුව මා නිසා ඔබ පිටට පැමිණි බව මට විශ්වාසයි.”



යෝනා මුහුදට විසි
කිරීමට නාවිකයන්ට
අවශ්‍ය නොවීය. ඒ නිසා
ඔවුහු නැව ගොඩබිමට
ගෙන ඒමට වෙහෙස
මහන්සි වෙමින් නැව
පැදවූවෝය. නමුත්
ඔවුන්ට එය කළ
නොහැකි විය.
කරන්නට තිබුණේ
එකම දෙයකි!



සමාව ඉල්ලා යාච්ඤා කිරීමෙන් පසු නාවිකයෝ
යෝනාව ඔසවා මුහුදට විසි කළෝය.
යෝනා රළ
පහර
අතරින්
අතුරුදහන් වූ
විට මුහුද නිශ්චල
වූ අතර සුළඟද
පහව ගියේය. කාලගුණයේ
හදිසි වෙනස්වීම ගැන නැවියෝ
කුණාටුවටත් වඩා බියට පත්
වූවෝය . එය කළ හැක්කේ
දෙවියන්ට පමණක් බව
ඔවුන් දැන සිටින්නට ඇත.
බියෙන් හා පුදුමයෙන්
ඔවුහු දෙවියන් වහන්සේට
නමස්කාර කළෝය.



මේ අතර දෙවියන් වහන්සේට අකීකරු වූ පණිවුඩ කරුවාට පුදුම දෙයක් අත්දකින්නට ලැබුණි. අසරණව මුහුදේ ගැඹුරේ ගිලෙමින් සිටි යෝනා කිසිවකට තමාව ගිලීමෙන් බේරාගත නොහැකි බව දැන සිටියේය. ඔහු දියේ ගිලී මිය යනු ඇත - නමුත් දෙවියන් වහන්සේට වෙනත් සැලසුම් තිබුණි.



සමිදාණන් වහන්සේ යෝනා ගිල දැමීමට විශාල මාළුවෙකු
සූදානම් කළ සේක. මාළුවා නියම වෙලාවට පැමිණියේය!
එක් වරම යෝනා මාළුවාගේ බඩට ඇතුල් විය.
යෝනා දින තුනක් මාළුවාගේ කුස ඇතුලේ
සිටියේය. ඔහුට සිතීමට හා යාච්ඤා
කිරීමට බොහෝ කාලයක් තිබුණි.



දින තුනකට පසු, යෝනා දෙවියන් වහන්සේට කීකරු වීමට පොරොන්දු වූයේය. එකෙණෙහිම, දෙවියන් වහන්සේගේ අණින් මාළුවා යෝනාව වෙරළට වැමෑරුවේය.



නැවත වරක් දෙවියන් වහන්සේ යෝනාට නිනිවයට ගොස් දෙවියන් වහන්සේගේ වචනය දේශනා කරන ලෙස කීසේක. මෙවර, යෝනා ගියේය! යෝනා නුවරට ඇතුළු වූයේ, "තව දින හතළිහකින් නිනිවය පෙරළා දමනු ලැබේ" කියා කෑගසමිනි.



නිනිවයේ වැසියෝ දෙවියන් වහන්සේගේ වචනය විශ්වාස කළෝය. ඔවුන් ආහාර නොගෙන ඔවුන්ගේ පව් ගැන කණගාටු වන බව දෙවියන් වහන්සේට පෙන්වීමට ගෝණි රෙදි හැඳ ගත්තෝය. රජු පවා දෙවියන් වහන්සේ ඉදිරියෙහි නිහතමානී වූයේය. ඔහු තම සිංහාසනයෙන් බැස, ගෝණි රෙදි ඇඳගෙන, අළු මත හිඳගත්තේය. ඔහු සෑම කෙනෙකුටම තම දුෂ්ඨ මාර්ගවලින් සහ ප්‍රචණ්ඩත්වයෙන් හැරී, ඔවුන්ට සමාව දෙන ලෙස ස්වාමින් වහන්සේට යාච්ඤා කරන්නට අණ කළේය.



දෙවියන් වහන්සේ ඔවුන්ට සමාව දුන් සේක!
උන්වහන්සේ තමන්ට සමාව දී ඇති බව මිනිසුන්ට වැටහුණු
විට එය නිනිවයේ පුදුමාකාර සතුටක් ඇති
දවසක් වන්නට ඇත. ඒත්
එක්කෙනෙක්ට
හොඳටම තරහ
ගියේය. ඒ
යෝනාටය!





යෝනා කෝප වූයේ මක්නිසාද?
“ඔබ කරුණාවන්ත, දයාවන්ත,
කෝපයට ප්‍රමාද වන,
කරුණාවෙන් මහත් වූ දෙවි
කෙනෙකු බව මම දැන
සිටියෙමි”යි ඔහු දෙවියන්
වහන්සේට කීවේය. වෙනත්
වචන වලින් කිවහොත්,
තමුන්ගේ පව් ගැන කණගාටු
වන සහ දෙවියන් වහන්සේගේ
වචනයට කීකරු වන අයට
දෙවියන් වහන්සේ සැමවිටම
සමාව දෙන බව යෝනා දැන
සිටියේය. නමුත් යෝනා
නිනිවයේ වැසියන්ට කැමති
නොවූවේය. දෙවියන් වහන්සේ
ඔවුන්ට සමාව දෙනවාට
ඔහු කැමති වූයේ නැත.

යෝනා දෙවියන් වහන්සේ කෙරෙහි කිපී, “මගේ ජීවිතය මගෙන් ගන්න; මන්ද, ජීවිතයට වඩා මරණය මට යහපත්යැ”යි කීවේය.



යෝනා නගරයෙන් පිටත වාඩි වී, දෙවියන් වහන්සේ ඊළඟට කුමක් කරනු ඇත්දැයි බලා සිටියේය. දෙවි සමිඳාණන් වහන්සේ විශාල කොළ සහිත පැළයක් වැඩෙන්නට සැලැස්වූ සේක. එය ඉක්මනින් වර්ධනය වූ අතර, මුළු දවසම උණුසුම් හිරුගෙන් යෝනාට සෙවන දුන්නේය.



පසුදා උදෑසන දෙවියන් වහන්සේ පණුවෙකු එවා උග ලවා ඒ ශාකය මරා දැමූ සේක. ඉන්පසු ස්වාමින් වහන්සේ උණුසුම්, තද සුළඟක් එවූ සේක. යෝනා තමුන් රස්නයෙන් මිය යාවියැයි සිතන තරමට උණුසුම දරුණු විය. මේ සියල්ලෙන් යෝනා තවත් කෝපයට පත් වූයේය.




ස්වාමින් වහන්සේ යෝනාට කතා කරමින්,
“නුඹට කෝප වීමට අයිතියක් තිබේද? නුඹේ
මහන්සි වීමක්වත් වැවීමක්වත් නැතුව
රාත්රියකින් හටගෙන රාත්රියකින්
නැතිවී ගිය ලබුවැල කෙරෙහි නුඹ
අනුකම්පා කළේය. දහස් ගණන්
සෙනඟ ඇති ඒ මහා
නගරය වන
නිනිවය කෙරෙහි
මා අනුකම්පා
නොකළ යුත්තේ
මන්දැ”යි ඇසූ සේක.

යෝනා සහ විශාල මත්ස්යයා

# දේව වචනයෙන් එක් කථාවක්

# බයිබලයේ

යෝනා

**“ඔබේ වචන පැහැදිලි වන විට ආලෝකය ලැබේ”**
**ගීතාවලිය 119:130**

# අවසානය

මෙම බයිබල් කථාන්තරය අපට පවසනුයේ, අප සෑදූ අපගේ මහෝත්තම දෙවියන් වහන්සේ පිළිබඳ දැනගෙන උන් වහන්සේ කව්දැ යි කියා හඳුනාගන්නා ලෙසයි.

දෙවියන් වහන්සේ විසින් පාපය යයි සලකන, අයහපත් දේ අප විසින් කර ඇති බව උන් වහන්සේ දන්නා සේක. පාපයට දඬුවම මරණයයි. එහෙත් දෙවියන් වහන්සේ අපට බොහො සේ ප්‍රේම කරන බැවින් උන් වහන්සේගේ එකම පුත්‍රයා අප වෙත එවූ සේක. ජේසුස් වහන්සේ කුරුසියේ වද වේදනා විඳිමින් ඔබේ පව් උදෙසා මරණයට පත් වු සේක. ජේසුස් වහන්සේ මරණයෙන් නැගිට, තමාගේ නිවස වන ස්වර්ගයට ගිය සේක. ඔබ ජේසුස් වහන්සේ පිළිගෙන ඔබගේ පාපයට කමාව අයැදින විට උන් වහන්සේ ඔබට කමාව දෙන සේක. එවිට උන් වහන්සේ ඔබ සමඟ ජීවත් වනු ඇත. ඔබට ද සදාකල්හිම උන් වහන්සේ සමඟ ජීවත් විය හැක.

මෙම සත්‍යය ඔබ පිළිගන්නේ නම් ජේසුස් වහන්සේට මෙසේ පවසන්න.

ආදරණීය ජේසුස් වහන්ස, ඔබ වහන්සේ, දෙවියන් වහන්සේ බව මම විශ්වාස කරමි. ඔබ වහන්සේ මිනිස් බව ගෙන මාගේ පාපය වෙනුවෙන් දිවි පුදා දැන් නැවතත් ජීවමානව වැඩසිටින සේක. මගේ ජිවිතයට පැමිණ මාගේ පාප කමා කරන මෙන් ඉල්ලා සිටිමි. එවිට මට ඔබ වහන්සේ සමඟ අලුත් ජීවිතයක් ගතකිරීමට හැකි ය. ඔබ වහන්සේ සමඟ සදාකාල ජීවිතයට ද මට දිනක් උදා වනු ඇත. ආමෙන්.

දිනපතා බයිබලය කියවා දෙවියන් වහන්සේ සමඟ කතා කරන්න (ශු. ජොහන් 3:16)